# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2170/2 - 2020 අප්‍රේල් මස 08 වැනි බදාදා - 2020.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) වැනි ව්‍යවස්ථාවට හා 46(1)(අ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මා විසින් 2019 දෙසැම්බර් මස 10 වැනි දිනැති අංක 2153/12 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, වරින්වර සංශෝධනය කරන ලද නිවේදනය, වහාම ක්‍රියාත්මකවන පරිදි තවදුරටත් පහත උපලේඛනයේ සඳහන් ලෙස සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2020 අප්‍රේල් මස 08 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

(1) එම නිවේදනයෙහි අංක (1)"ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි I වැනි තීරුවේ 36 සහ 37 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ආ) එහි I වැනි තීරුවේ අයිතම 35 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවේ 32 අයිතමය ඉවත් කිරීමෙන් ;

(ඈ) එහි III වැනි තීරුවේ පහත අයිතමයන් ඉවත් කිරීමෙන් ;

- ආගාමික හා විගාමික පනත (1948 අංක 20)
- පුරවැසි පනත (1948 අංක 18)
- ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)
- අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)
- අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39).


1A - G 032213 — 32 (2020/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එම නිවේදනයෙහි අංක (15)"මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි I වැනි තීරුවේ 38 අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

39. ආගමන හා විගමන කටයුතු
40. ශ්‍රී ලාංකික පුරවැසිභාවයට අදාළ කටයුතු ;

(ආ) එහි I වැනි තීරුවේ අයිතම 39 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවේ 26 අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

27. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ;

(ඈ) එහි III වැනි තීරුවේ "ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)" අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

- ආගාමික හා විගාමික පනත (1948 අංක 20)
- පුරවැසි පනත (1948 අංක 18)
- ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)
- අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)
- අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39).

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.